# ශ්‍රී ලාංකීය මානව හිමිකම් නීතිය තුළ වදහිංසාවෙන් මිදීමේ අයිතිය සංස්ථාපනය කිරීමේ ලා ධම්ම පදයෙන් ලබා ගත හැකි උපයෝගීතාවය

ඩී. සුපුන් රෂින්ද[1]

## ප්‍රවේශය

බුදු දහම එක් අතකින් මිනිසාගේ සංසාර විමුක්තිය සාධනය කිරීම පිණිස අවශ්‍ය කරුණු දේශනා කරන අතර අනෙක් අතින් බෝසත් සමාජයක් සංස්ථාපනය කිරීමට අවශ්‍ය කරන ධර්ම කාරණා ගණනාවක්ද දේශනා කර තිබේ. එහි මානව හිමිකම් සුරක්ෂිත කිරීමේ වැදගත්කම පිළිබඳ බුදුදහමේ එන ඉගැන්වීම් අද්විතීය වේ. මෙහිදී සෑම පුද්ගලයෙකුගේ ම කායික හා මානසික නිදහස ස්ථාපනය කිරීම පිළිබඳ මතවාදයන් සුවිශේෂී වන අතර ඊට අදාළ කරුණු රාශියක් බෞද්ධයාගේ අත්පොත වශයෙන් සැලකෙන ධම්ම පදය තුළ අන්තර්ගතකොට තිබේ.

මේ තත්ත්වය වර්තමානයේ ජාත්‍යන්තර ප්‍රජාව විසින් එක්සත් ජාතින්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය, කෲර සහ අමානුෂික වදහිංසාවෙන් වැළැක්වීමේ අන්තර්ජාතික සම්මුතිය, යටතේ සාකච්ඡා කරන අතර කෲර අමානුෂික වදහිංසාවෙන් මිදීමේ අයිතිය කිසිදු බේදයකින් තොරව සෑම මිනිසෙකුට ම, සෑම අවස්ථාවකදී ම හිමි විය යුතු අයිතිවාසිකමක් ලෙස පිළිගෙන තිබේ. එසේම ලොව සෑම රටක්ම මෙම අයිතිවාසිකම තම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන්ට අන්තර්ගත කොට ඇති අතර ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 සහ 13 ව්‍යවස්ථාවන්ගෙන්ද, කෲර අමානුෂික වදහිංසා වැළැක්වීමේ සම්මුති පනත මගින් ද, වදහිංසාවෙන් මිදීමේ අයිතිය අනුලංඝණීය අයිතියක් ලෙස පිළිගෙන තිබේ.

කෙසේ නමුදු නීතියට සාපේක්ෂව බලන කල බුදු දහමේ දැක්වෙන සංකල්පයන්ගේ සුවිශේෂිතාවය වන්නේ එතුළින් කර්මය, කර්මඵලය, අත්තුප්පනායක ධර්මපරියාය වැනි සංකල්පයන්ට මුල්තැන ලබාදෙමින් පවින් වැළැකීමේ ආදීනව මිනිසාට අවබෝධ කිරීමය. මේ තත්ත්වය තුළින් සෑම මිනිසෙක් ම අන් අයට වදහිංසා පැනවීමෙන් ස්වයංව වාරණය වන අතර එය නීතිය මගින් අප අපේක්ෂා කරන නිවාරණය පුනරුත්තාපනය වැනි මූලධර්ම සාක්ෂාත් වීමකි. එමෙන්ම සමාජ පාලන යන්ත්‍රණයක් ලෙස නීතිය වඩාත් බලවත් වන නමුත් එය බුදුදහම සමග සැසඳේීම්දී පෙනීයන්නේ සෑම පුද්ගලයෙකුගේ ම

---

[1] නිබන්ධ උපදේශක, පොදු සහ ජාත්‍යන්තර නීති අධ්‍යයන අංශය, කොළඹ විශ්වවිද්‍යාලය, supunkck@gmail.com

ස්වයං විනය ඇතිකිරීමේ ලා බුදුදහමට සුවිශේෂී කාර්යභාරයක් ඉටු කළ හැකි බවයි.

**අරමුණ**

- ශ්‍රී ලාංකීය මානව හිමිකම් නීතිය තුළ වදහිංසාවෙන් මිදීමේ අයිතිය ස්ථාපනය කිරීම උදෙසා නීතියට සහ බුදු දහමට එක්ව සිදු කළ හැකි කාර්යභාරය සාකච්ඡා කිරීම.
- ඒ සඳහා මෙරට ව්‍යවස්ථා සම්පාදනයෙහි සහ ප්‍රතිපත්ති සම්පාදනයෙහි සිදු විය යුතු වෙනස්කම් නිර්දේශ කිරීම.
- ධර්මානුකූල ජීවිතයක් ගතකිරීම තුළින් අවිහිංසාවාදී සමාජයක් නිර්මාණය කළහැකි ආකාරය සහ එහි වැදගත්කම පිළිබඳ මහජන කතිකාවක් ඇතිකිරීම.

**අධ්‍යයන විධික්‍රම**

ඕනෑම අධ්‍යයනයක් සාර්ථකව සිදු කිරීමේදී එහි න්‍යායාත්මක පැතිකඩ පමණක් නොව ප්‍රායෝගික භාවිතයද සලකා බැලීම වැදගත් වේ. ඒ අනුව මෙම අධ්‍යයනය සිදු කිරීමේදී ක්ෂේත්‍ර අධ්‍යයනය මෙන්ම පුස්තකාල පරිහරණයනයටද කටයුතු යොදනු ලැබීය.

වර්තමාන ලාංකීය නීති සන්දර්භය තුළ බුදුදහමේ උපයෝගීතාවය සලකා බැලීමේදී සාමාන්‍ය මහජනයාගේ, නීති වෘත්තිකයන්ගේ, මෙන්ම සංඝයා වහන්සේලාගේද අදහස් සලකා බැලීම වැදගත් වේ. මෙහිදි නියදීන් තෝරා ගැනීමේදී සම්පත් දායකයන් ජීවත් වන ප්‍රදේශ ඔවුන්ගේ දැනුම් මට්ටම මෙන්ම රැකියාව මතද පදනම් වූ අතර සාමාන්‍ය ජනතාවගේ අදහස් ප්‍රමාණාත්මක ක්‍රමවේදය අනුගමනය කරමින් ප්‍රශ්න මාලා භාවිත කොට ලබා ගන්නා ලදි. නීති වෘත්තිකයින්ගේ අදහස් ගුණාත්මක ක්‍රමයට සම්මුඛ පරීක්ෂණ ක්‍රමය ඇසුරෙන් ලබා ගැනීමට මෙහිදි හැකියාව ලැබුණි. එමෙන්ම භික්ෂූන් වහන්සේලාගේ අදහස් ලබා ගැනීමටද ගුණාත්මක ක්‍රමවේදය භාවිත කළ හැකි විය. නමුත් මෙම අධ්‍යයනයේ පහසුව උදෙසා සමීක්ෂණයට සහභාගී වුවන්ගේ ප්‍රමාණය 15 දෙනෙකුට සීමා කළ බව මෙහි ලා සඳහන් කිරීම වැදගත්වේ.

නමුදු සාර්ථක ලෙස අධ්‍යයනයන් නිම කිරීම සඳහා ක්ෂේත්‍ර අධ්‍යයනයක් පමණක් සිදු කිරීම ප්‍රමාණවත් නොවේ. එහිදි විවිධ විද්වතුන් පළ කළ න්‍යායාත්මක අදහස්ද උපයෝගි කර ගැනීම යෝග්‍ය වන අතර ඒ සඳහා පුස්තකාලය සහ අන්තර්ජාලය මගින් ලැබෙන පිටිවහල ලඝුකොට තැකිය නොහැක. මෙහිදි ප්‍රාථමික මූලාශ්‍ර ලෙස පනත් සහ අධිකරණ තීරණ ද, ද්විතීක මූලාශ්‍ර ලෙස ග්‍රන්ථ, විශ්ව කෝෂ, සගරා ලිපි, පුවත්පත් ලිපි ආදියද භාවිතයට ගන්නා ලදි.

## දත්ත විශ්ලේෂණය

ඉහතින් සාකච්ඡා කල ආකාරයට ශාස්ත්‍රීය අධ්‍යයනයක් හුදෙක් න්‍යායාත්මක පදනමක හිඳ සිදුකළ නොහැකි අතර මහජනතාව විසින් ඉදිරිපත් කරනු ලබන හරවත් වු අදහස් කෙරෙහිද අවධානය යොමු කිරීම වැදගත් වේ. මෙහිදී ජනතාව තමන්ගේ ආත්ම සංවරය ඇති කර ගැනීම පිණිස බුදු දහම යොදා ගත් ආකාරය පිළිබඳ අත්දැකීම් සඳහා වැඩි ඉඩකඩක් ලබාදුන් බව සඳහන් කළ යුතුය. ඊට අමතරව වර්තමාන නීතිය තුළ වදහිංසාවෙන් මිදීමේ අයිතිය ස්ථාපනය කොට ඇති ආකාරය පිළිබඳ ජනතාවගේ අදහස්, විවේචන මෙන්ම එහි පවතින ගැටලු විසදීම සඳහා බුදු දහම ඇසුරෙන් ඔවුන් ඉදිරිපත් කරන නිර්දේශද මෙහිදි සැලකිල්ලට ලක්විය. නමුත් ඇතැම් අවස්ථාවල මෙකී මහජන අදහස් දේශිය සහ අන්තර්ජාතික විද්වතුන්ගේ මත වාදයන් සමගද සංසන්දනය කෙරුණු අතර එතුළින් මහජන අදහස් තවත් මූර්තිමත් කොට ඵලදායි ලෙස යොදා ගැනීම අපේක්ෂාව වේ.

## අධ්‍යයනයේදී සොයා ගත් කරුණු

අප ඉහත සාකච්ඡා කළ අන්දමට අදවන විට වදහිංසාවෙන් මිදීමේ අයිතිය අනුල්ලංඝණීය මානව හිමිකමක් ලෙස සෑම දෙනා විසින්ම පිළිගෙන තිබේ. එසේම ජයම්පති වික්‍රමරත්න මහතා දක්වන අන්දමට යම් මිනිසෙකුට තවත් මිනිසෙකුට එරෙහිව සිදුකළ හැකි දරුණුත ම අපරාධය මෙයයි. (ජයම්පති වික්‍රමරත්න-2007, පිටුව 206) එබැවින් මෙකී අපරාධකරුවන් හඳුන්වනු ලබන්නේ Hostis Humini Generis හෙවත් මානව වර්ගයේ ම හතුරන් වශයෙනි.(ෆිලාටිකා එ පැනා ඉරේලා 1980, පිටුව.876)

බුදු දහමේදී මීට අදාළ අර්ථ නිරූපණය බොහෝ ගැඹුරු වූවකි. ධම්ම පදයට අනුව හිංසා නොකිරීම යනු සියලු බුදුවරුන්ගේ දේශනාවකි.(ධම්ම පදය, 185 ගාථාව) යමෙකු එවන් වරදක් කරතොත් ඔහු නීතියෙන් දඩුවම් ලැබුවද නොලැබුවද සිය හෘද සාක්ෂිය මගින් වේදනාවට ලක් වන ආකාරය ධම්ම පදයේ ගාථා ගණනාවකින් විග්‍රහ කොට තිබේ. එවන් පව්කම් කරන්නා නිරන්තරයෙන් ශෝක වේ, තැවේ. එමෙන්ම ඔහු දැවෙමින් කාලය ගත කරයි.(ධම්ම පදය, 137,138,139,140,159,160,161,162 ගාථා) ඊට අමතරව ඔහු මරණින් මතු දුගතියට පත් වෙන බවත් නිරයෙහි උපදින බවත් තවදුරටත් ධම්ම පදයේ දක්වා තිබේ. මෙකී විග්‍රහයන් නිසා සිදුවන සමාජ පාලනය පිළිබඳ සාකච්ඡා කිරීම වැදගත් වන අතර එය නීතියේ එන ප්‍රතිපාදන හෘදයාංගමව පිළිගැනීමට මිනිසුන් තව දුරටත් පොළඹවන්නකි. ධම්ම පදයේ තව දුරටත් දැක්වෙන ආකාරයට යමෙකුට හිංසා පීඩා කළහොත් එය අළුයට සැගවුණු ගිණි පුපුරු මෙන් නැවත යම් දිනෙක ඉස්මතු වේ.(ධම්ම පදය,71 ගාථාව)

(න හි පාපං කතං කම්මං, සජ්ජු ඛීරං'ව මුච්චති, ඩහන්තං බාලමන්වේති, භස්මච්ඡන්නොච පාවකෝ ) දෙවන ලෝක යුධ සමයේදී දහස් ගණන් අහිංසක මිනිසුන් ඝාතනය කළ අපරාධකරුවන්ට නියුරම්බර්ග් සහ ටෝකියෝ පර්ෂදවලදී හිමි වූ දණ්ඩනයන්ගෙන්ද යුගොස්ලෝවියා සහ රුවන්ඩා පර්ෂදවලදී යුධ

අපරාධකරුවන්ට හිමිවූ දණ්ඩනයන්ගෙන්ද හෙළිවන්නේ ධම්මපදයෙන් කියවෙන එකී සත්‍යතාවයයි.

එනමුත් මෙහිදී සුවිශේෂි වන්නේ ඕනෑම බරපතල අපරාධයක් සිදුකරන ලද්දකු දෙස බුදුදහමෙන් හෙලනු ලබන ධනාත්මක දෘෂ්ඨි කෝණයයි. ඒ අනුව යමෙකු තමන් සිදු කළ අපරාධය පිළිබඳ තැවෙමින් තොරව සිදුකළ යුත්තේ තම සිත කුසලයට පෙළඹවීමයි. එවිට ඔහු වලාපටින් මිදුණු පුන්සඳ සේ බබලමින් හාත්පස ආලෝකමත් කරන්නෙකු බවට පත් වේ.(ධම්ම පදය 173)

එය වරදට දඬුවමක් ලෙස බන්ධනාගාර ගත කිරීමට එහා ගිය සුභදායී සංකල්පයක් වන අතර බදු දහමේ අවසාන වශයෙන් අරමුණු කරන්නේ වැරදි සිදු කළ මෙන්ම සිදු නොකළ සියලු දෙනා නිවනට පැමිණීමයි.

## නිගමනය

සමස්තයක් ලෙස අධ්‍යයනය කෙරුණු දත්තයන් විශ්ලේෂණාත්මකව සලකා බැලීමේදී දක්නට ලැබෙන තත්වය වන්නේ නීතිය තුළින් සිදුකරන සමාජ පාලනයට අමතරව බුදු දහම මගින් සිදු කරන ස්වයං නිවාරණය සමාජය තුළ වදහිංසාවෙන් මිදීමේ අයිතිය ස්ථාපනය කිරීම උදෙසා බෙහෙවින් ඉවහල් වන බවයි. මෙ සමීක්‍ෂණයට සහභාගී වූ මහජනතාවගේ, සංඝයාවහන්සේගේ මෙන්ම නීතිවේදීන්ගේ ද අදහස වූ බව මෙහිදි සඳහන් කළ යුතු ය. ඒ අනුව එකී සියලු අදහස් සහ නීතියේ පවත්නා විධි විධාන සලකා බලා පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කිරීමට මා විසින් අදහස් කරමි.

**ප්‍රමුඛ පදඃ** ධම්ම පදය, වධ හිංසාවෙන් මිදීමේ අයිතිය, නීතියේ සංවර්ධනය පිණිස බුදුදහම

## ආශ්‍රිත ග්‍රන්ථ සහ ලිපි ලේඛන

ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
වදහිංසා වැලැක්වීමේ සම්මුති පනත 1994 අංක22
එක්සත් ජාතීන්ගේ වදහිංසා වැළැක්වීමේ අන්තර් ජාතික සම්මුතිය 1984
වික්‍රමරත්න, ජයම්පති. (2007). (2.සංස්.). *ශ්‍රීලංකාවේ මූලික අයිතිවාසිකම්.* ස්ටැම්ෆෝඩ්ලේක් පබ්ලිකේෂන් (පුද්ගලික) සමාගම. ශ්‍රීලංකාව
මනෝරංජනී සිංහල ධම්මපදය; (2012). ආචාර්ය රාජකීය පන්ඩිත මුවගම ඤාණසීහ නා හිමි, කොළඹඃ සීමාසහිත ඇම්.ඩී.ගුණසේන (පුද්ගලික) සමාගම.